අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/96/07/1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.09.

සියලුම පළාත් ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපතිවරුන්,
සියලුම පාසල්වල විදුහල්පතිවරුන්.

**ජාතික කියවීම් මාසය, පාසල් පුස්තකාල සතිය, පාසල් පුස්තකාල දින වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2024**

සෑම වර්ෂයක ම ඔක්තෝබර් මාසය ජාතික කියවීම් මාසය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව 2024 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීම් මාසයට සමගාමීව පාසල් සිසුන් සඳහා ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් පිළිබඳ මඟ පෙන්වීම සඳහා මෙම උපදෙස්මාලාව නිකුත් කරනු ලැබේ.

**01.ජාතික කියවීම් මාසය තුළ වැඩසටහන් පෙළගැස්ම**

පොත්පත් ඇතුළු හරවත් කියවීම් ද්‍රව්‍ය තෝරාගෙන කියවීම තුළින් සමබර පෞරුෂයකින් හෙබි සංවේදී දැනුමැති දරු පරපුරක් බිහි කරලීම සඳහා සෑම කෙනෙකුට ම කියවීම යාවජීව පුරුද්දක් බවට පත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් පෙළ ගස්වා ඇති අතර ඒවා පාසලට ගැළපෙන ආකාරයට සකස් කර ක්‍රියාත්මක කිරීම පාසලේ විදුහල්පතිගේ වගකීම වේ. මේ සඳහා අරමුදල් රැස් කිරීම හා සිසුන් හෝ දෙමාපියන්ගෙන් මුදල් හෝ වෙනත් ආධාර ආදිය ලබා නොගත යුතු අතර පාසලේ පවතින හෝ පාසලට ලැබෙන සම්පත් අවශ්‍ය පරිදි යොදා ගනිමින් පහත දැක්වෙන ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු වේ.

1.1 පාසල් සිසුන්ගේ කියවීමේ අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

1.2 පුස්තකාල පොත් ඇතුළුව පුස්තකාල කියවීම් ද්‍රව්‍ය එකතුව සංවර්ධනය කර ගැනීම හා පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
(උදා: පොත් සල්පිලක් පැවැත්වීම, වාර්ෂික පොත් පරිත්‍යාග දිනයක් ක්‍රියාත්මක කිරීම ආදිය)

1.3 සිසුන්ගේ පුස්තකාල භාවිතය වැඩිදියුණු කිරීම සහ කියවීම් රුචිකත්වය වර්ධනයට අදාළ කටයුතු කිරීම.

උදා-

- කියවීමේ වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම සඳහා දේශන, සාකච්ඡා, විවාද, කථික, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සංවිධානය සහ පොත් කියවීමට පොළඹවන අන්දමේ පෝස්ටර්, අත්පත්‍රිකා, වගන්ති ආදිය ප්‍රදර්ශනය කිරීම.

- කියවීමෙන් සාර්ථකත්වයට පත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිතාපදාන සහ ස්වයං චරිතාපදාන කෘති එකතුවක් ප්‍රදර්ශනය කිරීම හා එම පුද්ගලයින් පිළිබඳ සිසුන්ට හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කියවීමේ හැකියාව සඳහා ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ විකල්ප කියවීම් ද්‍රව්‍ය හඳුන්වා දීම මගින් තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කිරීම.
(උදා - චිත්‍රපට කියවීම, ටෙලි නාට්‍ය කියවීම, මුද්දර කියවීම වැනි දේ තුළින් හරවත් විකල්ප කියවීම් ද්‍රව්‍ය හඳුන්වා දීම සහ පොත් පාදක කරගත් භාෂා ප්‍රවර්ධන වැඩසටහන් ආදිය)

- පාසල තුළ කියවීම් කඳවුරු, කියවීම් සමාජ, පුස්තකාල සංගමය ආදිය සංවිධානය කිරීම.

- 2024 වසරේ පාසලේ හොඳම කියවන්නන්, තෝරාගෙන ඇගයීමට ලක් කිරීම.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

**02.පාසල් පුස්තකාල දිනය හා පාසල් පුස්තකාල සතිය සඳහා වැඩසටහන් පෙළගැස්ම.**

පාසල් පුස්තකාල සතියට සමගාමීව පුස්තකාල භාවිතය වැඩිදියුණු කිරීම සඳහා වන වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක කිරීම තුළින් ඒ පිළිබඳව කතිකාවක් සහ උද්යෝගයක් සිසුන් තුළ ඇති කිරීමත් ඒ මගින් එම සිසුන් තුළ ස්වයං ඉගෙනුම් කුසලතා සංවර්ධනය කිරීමත් අරමුණු කෙරේ.

පාසල් පුස්තකාල සතිය යෙදී ඇත්තේ සෑම වසරක ම ඔක්තෝබර් මාසයේ (කියවීම් මාසයේ) අවසන් සතියේ වන අතර එම සතියේ සඳුදා දිනය පාසල් පුස්තකාල දිනය ලෙස ජාතික වශයෙන් පිළිගෙන ඇත. ඒ අනුව 2024 වසරේ ඔක්තෝබර් 21 සඳුදා සිට ඔක්තෝබර් 25 වැනි සිකුරාදා දක්වා දින 05ක් පාසල් පුස්තකාල සතියට අදාළ වැඩසටහන් සංවිධානය කිරීම විදුහල්පතිගේ වගකීම වේ. එහිදී පුස්තකාල සතිය පන්ති මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා පන්ති පුස්තකාල නායකයෙකු/නායිකාවක පත් කර ගැනීම සුදුසු ය.

**2.1 2024.10.21 (පළමු දිනය)**

- 2024 වර්ෂයේ තේමාව (**"මග කියනා තරු ය අකුරු - පොත් කියවමු දිනමු මිතුරු"**) ඇතුළත් බැනරයක් පාසල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම.
- පාසලේ උදෑසන රැස්වීමේ දී "පුස්තකාල භාවිතයේ වැදගත්කම"පිළිබඳ කථාවක් පැවැත්වීම සහ පුස්තකාල දිනය හා සතිය ආරම්භවන බවට සිසුන් දැනුවත් කිරීම.
- ලබා දී ඇති තේමාව යටතේ සංගීත, නාට්‍ය, චිත්‍ර හා පෝස්ටර් හෝ වෙනත් නිර්මාණශීලී අංග සහිතව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**2.2 2024.10.22 දිනය (දෙවැනි දිනය)**

පුස්තකාලය තුළ හා ඒ අවට පිරිසිදු කිරීම සහ පරිසර අලංකරණ කටයුතු සිදු කිරීම.

**2.3 2024.10.23 දිනය (තුන්වැනි දිනය)**

විදුහල්පතිගේ මගපෙන්වීම යටතේ පුස්තකාල එකතුව සංරක්ෂණයට කටයුතු කිරීම.

**2.4 2024.10.24 දිනය (සිව්වැනි දිනය)**

පුස්තකාල එකතුව සංවර්ධනය සඳහා නව වැඩසටහන් හඳුන්වා දීම.

**2.5 2024.11.25 දිනය (පස්වැනි දිනය)**

පාසලේ ඵලදායී පාඨකයින් ඇගයීමට ලක් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් උපදෙස් අනුව ඔබ පාසලේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ වාර්තාවක් සකස් කර එය ගොනුගත කර පුස්තකාලය භාරයේ තබා ගත යුතු අතර අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණවල දී සහ වෙනත් අවශ්‍ය අවස්ථාවන්හි දී එය ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සුදුසු ය.

(මෙම උපදෙස් මාලාව www.gov.moe.lk අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ද පළ කර ඇත.)

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්